**<u>2019.10.02 දින III ශ්‍රේණියට බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට අදාළ ලේඛන සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු</u>**

1) අයදුම්පත්‍රයෙහි I සහ II කොටස් දෙකෙහිම සියලුම හිස්තැන් පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

2) දැනට සේවය කරන පාසලේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය (උසස්වීම් ලිපිය ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු බැවින් ලිපිනය නිවැරදිව සඳහන් කරන්න)

3) නිලධාරියා වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් (ප්‍රසූත නිවාඩු හැර) එම නිවාඩු අනුමත කිරීම සඳහා පළාත් ආණ්ඩුකාර කාර්යාලයෙන් හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද ලිපිවල සහතික කළ පිටපත් යොමු කළ යුතුය.

4) විනය, විගණන/විමර්ශන තත්වය සඳහන් කළ යුතු කොටසෙහි නිලධාරියා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විනය ක්‍රියාමාර්ග හෝ විගණන/විමර්ශන තොරතුරු නොමැති නම් එක් එක් තීරු වල ''නැත'' යනුවෙන් දැක්විය යුතුය.

5) නිලධාරියාගේ ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නම හා සහතික පත්‍රවල සඳහන් නම අතර වෙනසක් පවතින අවස්ථාවල ඒ පිළිබඳව තහවුරු කරන ලද දිවුරුම් ප්‍රකාශයක් යොමු කළ යුතුය.

6) අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සහ සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම වෙනුවෙන් අ.පො.ස(සා/පෙළ) විභාගයට මුහුණ දුන් නිලධාරීන් සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල සනාථ ලේඛනය යොමු කළ යුතුය. (විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කරගනු ලබන ලේඛන හෝ නිලධාරියාට නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන උසස්වීම සඳහා වලංගු නොවේ)

7) සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 06/2025 අනුව සන්ධාන භාෂාව ප්‍රමාද වී සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන්ගේ උසස්වීම් දිනය අයදුම් පත්‍රයෙහි නිවැරදිව සඳහන් කළ යුතුය.

8) සේවා සහතිකය නිකුත් කිරීමේ දී එහි දැනට දරන තනතුර සඳහන් විය යුතු අතර, පත්වීම් දින සිට පූර්වාසන්න වසර 06 තුළ සේවය කළ පාසල් සහ එම පාසල් වල සේවය කළ කාලසීමාවන් ද සඳහන් විය යුතුය.

9) උසස්වීම සඳහා විදුහල්පති ශාඛාව වෙත යොමු කිරීමේදී අදාළ ලේඛන වලින් සහතික කරනු ලැබූ එක් පිටපතක් බැගින් යොමු කිරීම ප්‍රමාණවත් වේ. (අනවශ්‍ය ලෙස පිටපත් අමුණා එවීමෙන් වළකින්න)

ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් අදාළ ලේඛන ඉදිරිපත් කිරීම තුලින් උසස්වීම් ලිපි නිකුත් කිරීමේදී අනවශ්‍ය ලෙස සිදුවන ප්‍රමාදයන් වළක්වා ගත හැක.

***මෙම සියළුම ලේඛන වල දෙමළ මාධ්‍ය පරිවර්තනය ඉදිරියේදී වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ලැබේ.**